අධ්‍යාපන අමාත්‍යාංශය

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය

# ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

# පුරප්පාඩු

අධ්‍යාපන අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය යටතේ පවතින ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. උපදේශක - දෙමළ මාධ්‍ය - (MA 2-2)

**වෘත්තීය :**

පිළිගත් ආයතනයකින් මෝටර් කාර්මික/මෙකාට්‍රොනික්/මිල්රයිට්/බල විදුලි/ශීතකරණ හා වායු සමීකරණ/යන්ත්‍රණ/වාහන විදුලි/ ඩීසල් පොම්ප/පෑස්සුම්/මෝටර් රථ බොඩි අලුත්වැඩියා හා පින්තාරු ශිල්පය යන ක්ෂේත්‍ර හෝ ලං.ජ.කා.අ.ආයතනයට අදාළ අනෙකුත් ක්ෂේත්‍රයන්හි NVQ 5 මට්ටමට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම සමග ලං.ජ.කා.අ.ආයතනයේ පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා පංති සාමාර්ථයක් ලබා තිබීම (I හෝ II පංති)

හෝ

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ මෝටර් කාර්මික/මෙකාට්‍රොනික්/මිල්රයිට්/බල විදුලි/ශීතකරණ හා වායු සමීකරණ/යන්ත්‍රණ/වාහන විදුලි/ඩීසල් පොම්ප/පෑස්සුම්/මෝටර් රථ බොඩි අලුත්වැඩියා හා පින්තාරු ශිල්පය යන ක්ෂේත්‍රවලට අදාළව වසර 04, 03 1/2 හෝ 03 ක පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා (I හෝ II පංති) පංති සාමාර්ථයක් ලබා තිබීම හා කර්මාන්තයේ වසර 03 ක පළපුරුද්ද හෝ පිළිගත් පුහුණු ආයතනයක අදාළ විෂයයන් ඉගැන්වීම පිළිබඳව අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව,
MA 2-2 - රු. 30,310 - 300X10-350X07-600X04-710X20-52,360/-
(මීට අමතරව රජය මගින් අනුමත ජීවන වියදම් දීමනාව සඳහා හිමිකම් ලබයි.)

**බඳවා ගැනීමේ ක්‍රමය** - තරගකාරී ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව** - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 02. වෛද්‍ය මධ්‍යස්ථාන සහායක - (MA 1-2)

**සුදුසුකම් :**

**බාහිර :**

අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් විද්‍යා විෂය ධාරාවේ පැරණි නිර්දේශය යටතේ විෂයයන් හතරකින් හෝ නව නිර්දේශය යටතේ විෂයයන් තුනකින් සමත්වීම සමග අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මනා දැනුමක් තිබීම සහ ප්‍රථමාධාර ක්‍රියාකාරකම් පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුය.

**අභ්‍යන්තර :**

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සමත් වී දැනට ප්‍රාථමික - ශිල්පීය නොවන (PL 1) හා ප්‍රාථමික - ශිල්පීය (PL 3) - වැටුප් කාණ්ඩයේ සිටින අයට මේ සඳහා අයදුම් කළ හැකිය.

**වැටුප් පරිමාණය** - කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව,
MA 1-2 - රු. 27,910 - 300X10-350X07-600X12-710X12-49,080/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනා සඳහා හිමිකම් ලබයි.)

**බඳවා ගැනීමේ ක්‍රමය** - තරගකාරී ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව** - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## සියලුම තනතුරු සඳහා අදාළ පොදු කොන්දේසි :

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- මානසික හා කායික වශයෙන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සුදුසු විය යුතුය.
- ඉතා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
- ඉහත තනතුරුවලට බඳවා ගන්නා බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයක් සැපිරිය යුතුය. ඔහු/ඇය එම කාලසීමාව අවසානයේ දී පෙන්වනු ලබන සතුටුදායක කාර්ය සාධනය සහ පැවැත්ම අනුව, තනතුරෙහි ස්ථිර කරනු ඇත. දැනටමත් තනතුරෙහි ස්ථිර කර ඇති අභ්‍යන්තර අයදුම්කරුවන් වසර 01 ක වැඩබලන කාලසීමාවකට යටත් වනු ඇත.
- ඉහත තනතුරුවලට බඳවා ගැනීම් අදාළ තනතුරෙහි ආරම්භක වැටුප් පියවරට වේ.
- සේවක අර්ථසාධක අරමුදල සඳහා වැටුපෙන් 08% ක් අයකර ගනු ලබන අතර, ඊට ආයතනයේ දායකත්වය 12% ක් හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා 3% ක් වේ.

**අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල ඡායා පිටපත් ස්වකීය අයදුම්පත සමග අමුණා එවිය යුතුය.**

**(අ) උප්පැන්න සහතිකය**

**(ආ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික**

**(ඇ) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික**

**(ඈ) ජාතික හැඳුනුම්පත**

දැනට රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ දෙපාර්තමේන්තුවල සේවය කරන අය තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් එවිය යුතු අතර, අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානියා සහතික කළ යුතුය. ඥාතීන් නොවන ඔබ පිළිබඳව විමසිය හැකි දෙදෙනෙකු ඇතුළත්ව සම්පූර්ණ විස්තර සහිත අයදුම්පතක් තමා විසින් සහතික කරන ලද සහතිකවල පිටපත් සමග **2024-01-30** දිනට ප්‍රථම **කළමනාකාර - පරිපාලන හා මානව සම්පත්, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, අංක 582, ගාලු පාර, ගල්කිස්ස** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි අයදුම්කරන තනතුර හා ආයතනය/මධ්‍යස්ථානය නිවැරදිව සඳහන් කළ යුතු අතර, කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

බඳවා ගැනීමට කිසිදු ආකාරයකින් බලපෑමක් කිරීම බඳවා ගැනීමට නුසුදුසුකමක් වනු ඇත.

**අධ්‍යක්ෂ-විදුහල්පති,**
**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය,**
**අංක 582, ගාලු පාර,**
**ගල්කිස්ස.**